# 27. මින්නේරිය වැව ආශ්‍රිත ගොවි ජනපද ව්‍යාපාරය.

කේ.කේ.පී.කේ.එම් සෙනරත්.

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ අතීතයේ පටන් ප්‍රධාන ජීවනෝපාය වශයෙන් හඳුනා ගැනෙන කෘෂිකර්මාන්තයේ වැදගත් සංධිස්ථානයන් අධ්‍යයනය කිරීමේ දී වාරි තාක්ෂණය හා බැඳී පවතින්නා වූ ගොවි ජනපදයන්හි තොරතුරු හඳුනා ගැනීම ඉතාමත් වැදගත් වනු ඇත. අතීත කෘෂිකාර්මික ජන සමාජය ගොඩ නැගීමෙහි ලා ගොවි ජනපද ඇති වීම පුරෝගාමීත්වය ගනිද්දී වර්තමාන ගොවි ජනපද ව්‍යාපාරයේ ආරම්භය වශයෙන් සැලකෙන්නා වූ මින්නේරිය වැව ආශ්‍රිතව ගොඩ නැගෙන ලද ගොවි ජනපද  ව්‍යාපාරය විශේෂය. එහි දී මින්නේරිය වැව ආශ්‍රිතව ගොඩ නැගුණු පළමුවන ගොවි ජනපද ව්‍යාපාරයේ ආරම්භය පිළිබඳව අධ්‍යයනය කළ හැකි තතු බොහෝමයකි. එලෙස මේ පිළිබඳව දැනට වාර්ථා වී ඇති තොරතුරු පිළිබඳව මෙම ලිපිය මඟින් අධ්‍යනය කිරීමට යෙදේ. එතුළ විශේෂ අවධානයක් යොමු කෙරෙන කරුණු කිහිපයකි. එනම් මින්නේරිය වැව ආශ්‍රිතව ගොවි ජනපද ව්‍යාපාරය ආරම්භ කිරීමට පුරෝගාමී වූ අදහස් හා ඒ සම්භන්ධව සිටින ලද ක්‍රියාකාරී පිරිස් කවරේද යන්න, මින්නේරිය ගොවි ජනපද ව්‍යාපාරයේ ආරම්භයට ඇති වූ බාධාවන් මොනවාද යන්න මෙන්ම එලෙස ජනපද ආරම්භයට එල්ල වූ බාධා ජය ගනිමින් ගොවි ජනපද ව්‍යාපාරය ගොඩ නංවන ලද්දේ කුමන ආකාරයකින් ද යනාදී මූලික කරුණු පිළිබඳව සාකච්ඡා කිරීම මෙම ලිපියෙහි මූලික අරමුණ වශයෙන් හඳුනා ගනිමු. ජනපද ආරම්භ කිරීම තුළ ආරම්භක අවස්ථාව පටන් අවසන් අවස්ථාව තෙක් බැඳී පවතින ඉහත වූ සියලු සාධක පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී තොරතුරු රැසක් අනාවරණය වේ.

මෙහි දී මෙම පර්යේෂණාත්මක අධ්‍යයනය වුදෙසා අවශ්‍ය කෙරෙන දත්ත සහ තොරතුරු ලබා ගැනීම වුදෙසා ප්‍රාථමික මූලාශ්‍රයන් මෙන්ම ද්විතීයික මූලාශ්‍රයන් ද භාවිතයට ගත හැකි අතර මෙම ප්‍රධාන මූලාශ්‍ර ක්‍රමවේදයන් ද්විත්වයට අමතරව ක්ෂේත්‍ර අධ්‍යයනය තුළින් මුණගැසෙන විවිධ පුද්ගල කණ්ඩායම් ඔස්සේ ද දත්ත රැස් කර ගැනීමට හැකි වේ. මේ ආදී වශයෙන් සියලු පාර්ශවයන්ගේ මැදිහත්වීම මත ලබා ගන්නා තොරතුරු ඔස්සේ මින්නේරිය වැව ආශ්‍රිත ගොවි ජනපද ව්‍යාපාරයේ ආරම්භය පිළිබඳ වැදගත් තොරතුරු රාශියක් අනාවරණය කර ගත හැකි අතරම එහිදී මෙරට ඉතිහාසයේ වැව් ආශ්‍රිතව ඇති කරන ලද විශිෂ්ඨතම ගොවි ජනපද ව්‍යාපාරය වශයෙන් සැළකෙන ගොවි ජනපද ව්‍යාපාරයේ ආරම්භක ව්‍යාපාර අතර වැදගත් තැනක් ගනු ලබන මින්නේරිය ගොවි ජනපද ව්‍යාපාරය පිළිබඳව දත් නොදත් තතු රැසක් පිළිබඳව අනාවරණය කර ගැනීමට අවස්ථාව උදා වනු ඇත.

## විමර්ශනය

මෙරට වාරි කර්මාන්තය ආශ්‍රිතව පිහිටුවන ලද ගොවි ජනපද ව්‍යාපාරයට සමගාමීව හඳුනා ගැනෙන මින්නේරිය වැව ආශ්‍රිතව ගොවි ජනපදයක් පිහිටුවීම පිළිබඳව මුල්ම වරට අදහසක් ඉදිරිපත් වීම පිළිබඳව සැළකීමේ දී ඒ සඳහා මුල් වූ ප්‍රධාන සාධකයන් ද්විත්වයක් පිළිබඳව තොරතුරු සඳහන් වේ. එකිනෙක බැඳී පවතින වැඳගත් සාධක දෙකක් වන මින් පළමුවැන්න වශයෙන් හඳුනා ගනුයේ පිටතින් ගෙන්වූ ජනතාව පදිංචි කොට වියළි කලාපයේ ජනපද පිහිටුවීම තුළින් මෙම ප්‍රදේශය තුළ කෘෂිකර්මාන්තය නංවාලීමේ සංකල්පය යි. ඒ හා බැඳී පවතින අනෙක් සාධකය වනුයේ මින්නේරිය වැව ආශ්‍රිත පළමුවන සාර්ථක ගොවි ජනපදයක් පිහිටුවීම පිළිබඳ ප්‍රයත්නය යි. ආදි කාලයේ පටන් සිදු වන්නා වූ වාරි කර්මාන්තයන් පිහිටුවීමේ ක්‍රියාවලිය සමඟ බැඳී පවතින ගොවි ජනපද පිහිටුවීම පිළබඳව සාකච්ඡා කිරිමේ දී බ්‍රිතාන්‍ය

පාලනය යටතේ වාරිමාර්ග ප්‍රතිසංස්කරණයන් බහුල වශයෙන් සිදු කරනු ලැබූවද ඊට පෙර කාලයන්වලදී පටන් ජනතාව පදිංචි කරවීම සිදු කරන ලද බවට සාධක හමු වේ. 1840 දී නුවරකලාවියේ දෙමළ ජන පදිකයින් පදිංචි කරවීමේ යොජනා ඉදිරිපත් වීමේ පටන් ජනාකීර්ණ පෙදෙස්වලින් වැසියන් වියළි කලාපය වෙත ගෙන්වා ජලය සහ ඉඩම් සහිත ප්‍රදේශයන්වල පදිංචි කරවීමට විවිධ අවස්ථාවන්වල දී උත්සාහයන් ගනු ලැබූ බව හඳුනා ගනී. මෙරට ගොවි ජනපද ව්‍යාපාරයේ අතීතය පිළිබඳව සොයා බැලීමේ දී එහි ආරම්භක අවස්ථාව දහනම වන සියවස දක්වා දිවෙන බව පෙනේ. 1890 දී මෙරට යටත් විජිත ලේකම්වරයා වශයෙන් සිටි අය විසින් මෙරට ජනාකීර්ණ ප්‍රදේශවල පිරිස් ප්‍රතිසංස්කරණය කරන ලද වැව් ආශ්‍රිතව පදිංචි කරවීම පිළිබඳව යෝජනාවලියක් 1890 අගෝස්තු දහසයවන දින පවත්වන ලද ඒජන්තවරුන්ගේ සම්මේලනයේ දී ඉදිරිපත් කොට ඇත. එලෙස ඉදිරිපත් කරන ලද ජනපද ඇති කිරීමේ යෝජනාවලිය ආර්.ඩබ්ලිවු අයිවර් විසින් පිළිගැණුනු අතර මෙය මෙරට ගොවි ජනපද පිහිටුවීම පිළිබඳ ඉදිරිපත් වන මුල් අදහස් වන බව හඳුනා ගත හැක. බ්‍රිතාන්‍ය පාලන සමයේ දී මෙලෙස ජනපද පිහිටුවීම පිළිබඳව අදහස් ඉදිරිපත් වත්ම වියළි කලාපය තුළ ගොවි ජනපද පිහිටුවීමෙහිලා මුල්ම පියවරයන් ගනු ලැබුවේද බ්‍රිතාන්‍ය පාලන සමය තුළ වීම විශේෂත්වයකි. එලෙස ගනු ලැබූ පළමුවන ප්‍රයත්නය වශයෙන් 1891 වසරේ දී අනුරාධපුර ඒජන්ත වූ ආර්.ඩබ්ලිවු අයිවර් විසින් උතුරු මැද පළාත තුළ කලාවැව පදනම් කර ගනිමින් ගොවි ජනපද පිහිටුවීමට ගත් උත්සාහය පෙන්වා දිය හැකිය. එහිදී අදාල ව්‍යාපෘතිය උදෙසා දිස්ත්‍රික්කය තුළින් තෝරා ගත් පවුල් කිහිපයක් ගෙන ගොස් ඒ ආශ්‍රිත පදිංචි කරවීම සිදු කළ නමුදු එය අසාර්ථක වීම හේතුවෙන් යාපනයෙන් දෙමළ පවුල් කිහිපයක් ගෙන්වා පදිංචි කිරීමේ කටයුතු සිදු කරන ලදි. මෙසේ සිදු කරන ලද කලා වැව ආශ්‍රිත ව්‍යාපාරවලින් අනතුරුව නාච්චදුව වැව ආශ්‍රිතව ද ජනතාව පදිංචි කර ගොවි ජනපද ඇති කිරීමට 1920 වසරේ දී නැවත වරක් උත්සාහ දැරුවද මෙම සියලු ගොවි ජනපද ව්‍යාපෘති අසාර්ථක වීම තුළ උතුරු මැද පළාත තුළ ගොවි ජනපද ඇති කිරීමේ කාර්යය දිගින් දිගටම අසාර්ථක තත්ත්වයක් ගත් බව හඳුනා ගත හැක.

මෙසේ මෙරට ගොවි ජනපද ව්‍යාපාර සියල්ලක්ම පාහේ අසාර්ථක වන පසුබිමක් තුළ කලා වැව සහ මින්නේරිය වැව පාදක කර ගනිමින් 1920 කාල වකවානුවේ දී ව්‍යාපාරික ආයතනයන් කිහිපයක් එකට එක්ව මහා පරිමාණයෙන් වී ගොවිතැන් කිරීම උදෙසා ගත් උත්සාහයන් ද සාර්ථක නොවීය. මින්නේරිය වැව ආශ්‍රිතව ගොවි ජනපද ඇති කිරීම කෙරෙහි මුල් වරට අවධානය යොමු වන්නේ මෙම ව්‍යාපාරිකයන් විසින් වී වගාවන් සඳහා මෙම භූමිය යොදා ගැනීමත් සමඟය. මේ අයුරින් වියළි කලාපයන් තුළ ගොවි ජනපද ව්‍යාපාරයන් අසාර්ථක වීම සමඟ 1929 වසරවල දී නිකුත් කරන ලද ඉඩම් කොමිසමේ වාර්තාවෙන් නිර්දේශ කොට ඇත්තේ ඉඩම් හිඟයට හා ජනාකීර්ණ ගැටලුවට පිළිතුරු සෙවීම සිදු කළ යුත්තේ තෙත් කලාපය තුළ බවයි. තෙත් කලාපය තුළ ගොවි ජනපද පිහිටුවීම කෙරෙහි අවධානය යොමු කල යුතු බව එමඟින් ඉදිරිපත් කරනු ලබයි. මෙම සාධක සියල්ලක්ම අධ්‍යනය කිරීමේ දී 1930 පමණ වන තෙක්ම වියළි කලාපය තුළ ගොවි ජනපද ඇති කිරීමට ගත් සියලු උත්සාහයක්ම අසාර්ථක වූ බව තහවුරු වන අතර මේ අයුරින් කලා වැව හා නාච්චදුව වැව ආශ්‍රිතව ඇති කිරීමට ගත් ගොවි ජනපද ව්‍යාපාරය මෙන්ම මින්නේරිය සංවර්ධන සමාගම ආරම්භ කරන ලද ව්‍යාපෘතිය අසාර්ථක වීම කෙරෙහි බලපෑ කරුණු කිහිපයක් හඳුනා ගත හැක. එලෙස මෙම ගොවි ජනපද ව්‍යාපාරයන් අසාර්ථක වීම තුළ මින්නේරිය වැව ආශ්‍රිත ජනපද ව්‍යාපාරය ද අසාර්ථක වීම කෙරෙහි බෙහෙවින් ම හේතු වූ ප්‍රධාන සාධකයන් ලෙස මින්නේරිය ව්‍යාපෘතියට අවශ්‍ය ශ්‍රමිකයන් ලබා ගැනීම අපහසු වීමට හේතු වශයෙන් හඳුනා ගැනෙන ලෙඩ රෝග හා අයහපත් සෞඛ්‍ය තත්ත්වයන්ගේ බලපෑම හඳුනා ගත හැකිය. මේ අයුරින් දිගින් දිගටම වියළි කලාපය තුළ ගොවි ජනපද ආරම්භ කිරීම

අසාර්ථක වන අවදියක ජනපද පිහිටුවිය යුත්තේ තෙත් කලාපයේ බව පිළිගත් අවස්ථාවක මින්නේරිය වැව පාදක කර ගනිමින් ගොවි ජනපදයක් පිහිටුවීම යනු ඉතාමත් වැදගත් අවස්ථාවක් වශයෙන් හැඳින්වීම වඩා නිරවද්‍ය වනු ඇත.

මෙසේ හඳුනා ගන්නා වූ මින්නේරිය ගොවි ජනපද ව්‍යාපාරය පිළිබඳව සඳහන් වන තවත් වැදගත් තතු රාශියකි. මහාමාත්‍ය ඩී.එස් සේනානායක විසින් ප්‍රකාශ කරනු ලබනුයේ ''මින්නේරිය ගොවි ජනපද ව්‍යාපාරය ඔහුගේ සංකල්පයක් විය'' යනුවෙනි. මෙලෙස සේනානායකයන් විසින් මින්නේරිය ගොවි ජනපද ව්‍යාපාරය ඇති කිරීම ඔහුගේ අදහසක් වන බව ප්‍රකාශ කිරීම පිළිබඳව විවිධ විද්වත් මතයන් වේ. ඒ තුළ සර් ජෝන් කොතලාවල විසින් පවසනු ලබන්නේ වෙනස්ම අදහසකි. ඔහු විසින් පෙන්වා දෙන්නේ මඩකලපුව තෙක් ඉදි කරන ලද නව දුම්රිය මාර්ගයේ මංගල ගමන සඳහා ව්‍යවස්ථාදායක සභාවේ මන්ත්‍රීවරු සමඟ එක්වන ඩී.එස් සේනානායකන් මින්නේරිය අසලදී දුම්රියෙන් බැස ඒ අසල පැවති කැළයට ගිය බවත් එහි දී ඔහුට මින්නේරිය වැව් බැම්මේ නටඹුන් හමු වී ඇති බවත් එය දුටු සේනානායකයන් පැරණි ලක්දිව රජ දවස මෙන් පෙරදිග ධාන්‍යාගාරය බවට නැවත මෙරට පත් කිරීමේ අදහසින් පැරණි වැව් හා ඇළවල් ප්‍රතිසංස්කරණය කොට ප්‍රයෝජනයට ගැනීමේ අදහස ඔහු තුළ ඇති වූ බවත් මෙම අදහස සමඟ මින්නේරිය ගොවි ජනපද පිහිටුවීමේ අදහස ඩී.එස් සේනානායකන් තුළ ඇති වූ බවත් ය. සේනානායකයන්ගේ මෙම ප්‍රකාශනය මෙන්ම කොතලාවල විසින් ඒ පිළිබඳව ඉදිරිපත් කරන ලද අදහස් ද ප්‍රායෝගිකත්වයට පත් වූ අවස්ථාවක් වේ. ඒ මින්නේරිය ගොවි ජනපද පිහිටුවීමේ සැලැස්ම රාජ්‍ය මන්ත්‍රණ සභාව වෙත ඉදිරිපත් කරමින් එහි දී ඒ සඳහා පැමිණි විරෝධතා මැඩ ගනිමින් ඩී.එස් විසින් ගෙන ගිය උත්සාහය යි. මෙලෙස මින්නේරිය ජනපද ඇති කිරීමේ පුරෝගාමියා ඩී.එස් බව පිළිනොගත් මතයන් ද ඉදිරිපත්ව ඇත. ඒ බර්නාඩ් අලුවිහාරේ විසින් සේනානායකයන්ගේ පුරෝගාමීත්වය ප්‍රතික්ෂේප කළ අවස්ථාවයි. ඔහු පවසන්නේ මින්නේරිය ව්‍යාපාරයේ මැවුම්කරු වශයෙන් ඩී.එස් හුවා දැක්වීම පුවත්පත් විසින් සිදු කරන ලද්දක් වන බවයි. මෙලෙස සේනානායකයන් ප්‍රතික්ෂේප කරනු ලබන අලුවිහාරේ විසින් අදහස් කරන්නේ මෙම මින්නේරිය ගොවි ජනපද ඇති කිරීමේ අදහස මුලින්ම ඇති වනුයේ 1892 දී වන බවයි. එහෙයින් ඩී.එස් මෙහි පුරෝගාමියා නොවන බවත් ඩී.එස් විසින් සිදු කරන ලද්දේ මෙම අදහසට නව පණක් ලබා දීම පණක් වන බවත් අලුවිහාරේ පවසයි.

මෙම සියලු කරුණු අධ්‍යනය කිරීමේ දී 19 වන සියවස මැද භාගයේ පමණ පටන් මෙරට ගොවි ජනපද ඇති කිරීම පිළිබඳ අවධානය යොමුව ඇති බව හඳුනා ගත හැකි වන අතර 1892 දී අනුරාධපුර දිස්ත්‍රික් ඉන්ජිනේරුවරයාගේ උපදෙස් මත උතුරු මැද පළාතේ වාරිමාර්ග මණ්ඩලය ජලය අපතේ යාම වළක්වා අක්කර 20 000 ක් පමණ වූ භූමියක් වගා කිරීමට ප්‍රමාණවත් ජලය රැඳවිය හැකි පිරිදි මින්නේරිය වැවේ සොරොව් ප්‍රතිසංස්කරණය කිරීමට අදාළ යෝජනා ඉදිරිපත් කිරීමත් මින්නේරිය ගොවි ජනපද ඇති කිරීමේ ප්‍රායෝගික ක්‍රියාවලියේ වැදගත් සංධිස්ථානයක් වශයෙන් හඳුනා ගත හැක. ඒ වන විට මින්නේරිය වැව දැඩි ලෙස අබලන් තත්ත්වයකට පත්ව තිබූ බවට තොරතුරු සඳහන් වන අතර එහි සොරොව්ව ද ඒ වන විට කැඩී ගොස් වැව් ජලය පිටතට ගලා යන තත්ත්වයක පැවති බව සඳහන් වේ. මෙම තත්ත්වය හමුවේ යෝජිත ප්‍රතිසංස්කරණයන් වුදෙසා මධ්‍යම වාරිමාර්ග මණ්ඩලයේ අනුමැතිය හිමි වීමෙන් අනතුරුව 1894 දී අදාල ප්‍රතිසංස්කරණයන් මින්නේරිය වැව ආශ්‍රිතව සිදු කරන ලද බව තොරතුරුවල සඳහන් වේ. සර් ජෝන් කොතලාවලගේ ඩී.එස් පිළිබඳ අදහස බර්නාඩ් අලුවිහාරේ විසින් ප්‍රතික්ෂේප කිරීමට පදනම් වූ ප්‍රධානතම කරුණ වශයෙන් මින්නේරිය වැව ආශ්‍රිතව විශාල භූමි ප්‍රමාණයක් වගා කළ හැකි පරිදි ප්‍රතිසංස්කරණයන් සඳහා ගෙන ආ යෝජනාව මුලින්ම ඉදිරිපත් වීම අවධානයට ලක් කළ

නිසා වන බව මෙමඟින් උපකල්පනය කළ හැකිය. එහි දී බර්නාඩ් අලුවිහාරේ විසින් මින්නේරිය වැව ආශ්‍රිතව සිදු කරන ලද ප්‍රතිසංස්කරණයන් හා එහි ජනපද ආරම්භ කිරීම යන කරුණු ද්විත්වය ම එකක් සේ සලකා කටයුතු කොට ඇති බව හඳුනා ගත හැක. මේ අයුරින් මින්නේරිය ආශ්‍රිතව සඳහන් වන තොරතුරුවලට අනුව 1933 ට පෙර මින්නේරිය වැව ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු මෙන්ම එහි මහා පරිමාණයෙන් ඉඩම් වගා කිරීමට ද අසාර්ථක උත්සාහයක් ගෙන ඇති බව හඳුනා ගත හැක.

මේ අයුරින් වියළි කලාපය තුළ ජනපදකරණය දිගින් දිගටම අසාර්ථක වීමත් සමඟ මින්නේරිය යටතේ නැවත වරක් නව සැළැස්මක් සමඟ ගොවි ජනපදයන් ආරම්භ කිරීමට ඩී.එස් සේනානායකයන් විසින් කටයුතු කරන ලද බව සඳහන් වේ. එලෙස මින්නේරිය ගොවි ජනපද ව්‍යාපාරයට නව පණක් ලබා දීමට සේනානායකයන් විසින් කටයුතු කිරීම තුළ මින්නේරිය වැව ආශ්‍රිත ගොවි ජනපද පිහිටුවීමේ සංකල්පයේ නිර්මාතෘවරයා වශයෙන් ඔහු හැඳින්වීම ද වරදක් නොවන බව සිතිය හැක. ඉහතින් සඳහන් කළ පරිදි 1894 දී වැවේ කැඩී බිඳී ගිය සොරොව්ව ආදිය ප්‍රතිසංස්කරණය කරනු ලැබුව ද එය වැඩි කලක් නොපැවතී ප්‍රධාන සොරොව්වේ දොරටු අවහිර වී බිසෝ කොටුව ගිලා බැසීමට ලක් විය. මෙලෙස නැවත වරක් වැවේ ප්‍රධාන සොරොව්වට හානි වීමෙන් අනතුරුව නැවත වරක් අලුතින් සොරොව් 3ක් ඉදි කොට ප්‍රධාන සොරොව්වේ සිට ජලය ගෙන යාම උදෙසා සැතපුම් නවයක් දිග ඇළක් ඉදි කිරීමට සැළසුම් කරනු ලැබීය. එහි කටයුතු 1897 දී ආරම්භ කරනු ලැබුව ද අවශ්‍ය ශ්‍රමිකයන් ප්‍රමාණවත් පරිදි සපයා ගැනීමට නොහැකි වීම හේතුවෙන් එහි වැඩකටයුතු අවසන් කිරීමට 1903 දක්වා කාලය ගත විය. එහි දී සොරොව් දෙකක් පමණක් ඉදිකෙරුණු අතර යෝජිත ක්‍රියාවලියෙන් වැවේ වාන හා ඇළ මාර්ගයේ සැතපුම් හතරක් ඉදිකොට අවසන් කෙරීය. මෙසේ මින්නේරිය වැව සහ සොරොවුව, ඇළ මාර්ගය යනාදියේ ප්‍රතිසංස්කරණයන් අවසන් කළේ වුව ද ඒ යටතේ අලුතින් කුඹුරු අස්වැද්දීමට ආණ්ඩුව බලාපොරොත්තු වූ පරිදි ගොවීන් පොළඹවා ගැනීම පහසු කාර්යයක් නොවීය. ඊට අවශ්‍ය දිරි ගැන්වීම්, මාර්ග ඉදි කිරීම, ඉඩම් පවරා දීම මෙන්ම එම ඉඩම්වල දැව ප්‍රයෝජනයට ගැනීම් ආදිය ද සැළැස්මකට අනුව සිදු කිරීමට එවක පාලනය කටයුතු කරන ලදි. මෙම කටයුතුවල කළමණාකරු වශයෙන් පත්වන ලද ඒ. ඊ. බර්ඩ් යටතේ සමාගමට ලබා දුන් ඉඩම් අක්කර 250 බැගින් බෙදා එක් කොටසකට ජනපද නිලධාරියෙකු බැගින් පත් කොට සංවර්ධන ක්‍රියාවලිය සිදු කළ ද වර්ෂයේ අවසන ඇති වූ වර්ෂාව සමඟ සියල්ල අඩාල විය. ඒ සමඟ ගමනාගමනයට බාධා ඇති වීම, මැලේරියාව පැතිරීම මෙන්ම වගා බිම් වන සතුන් විනාශ කිරීම ආදිය සමඟ ජනපද ව්‍යාපාරය අසාර්ථක විය. ඒ අතර ඉන්දියාවෙන් ශ්‍රමිකයන් ගෙන්වා ඉඩම් වගා ඇරඹීමට සූදානම් වුව ද සිංහල රජ දවස පැවති සමෘධිය නැවතත් ලගා කර ගැනීමේ ජාතික හැඟීමෙන් යුතුව මින්නේරිය යටතේ ඉඩම් වගා කිරීමේ යොජනාවක් ලංකා මහජන සභාව විසින් ඉදිරිපත් කරනු ලැබීය. නමුත් එය ද අසාර්ථක විය.

මින්නේරිය වාරි කර්මාන්තය හා බැඳී පවතින මින්නේරිය ගොවි ජනපද ව්‍යාපාරයේ තවත් වැදගත් අවස්ථාවක් වශයෙන් 1923 වසරේ දී වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් මින්නේරිය වැව යටතේ වාරිමාර්ග ප්‍රතිසංස්කරණය හා ඉඩම් සංවර්ධනය පිළිබඳව සමීක්ෂණයක් සිදු කිරීම හඳුනා ගත හැකිය. මෙම සමීක්ෂණයේ දී මින්නේරිය වැවේ පවතින්නා වූ ජල ධාරිතාව පිළබඳව මෙන්ම වැව පදනම් කර ගනිමින් වගා කළ හැකි ඉඩම් ප්‍රමාණය පිළිබඳව ද අධ්‍යනය කළ බව සඳහන් වේ. ඒ යටතේ විශේෂයෙන් මින්නේරිය වැව යටතේ පෝෂණය වීමට යෝජිත කුඹුරු ඉඩම් සඳහා ජලය සපයන වාරි මාර්ග පද්ධතිය කුමන ආකාරයකින් සකස් විය යුතු ද යන්න පිළිබඳව වැඩි අවධානයක් යොමු කොට ඇත.ඉන් අනතුරුව නැවත වතාවක් 1931 වාරිමාර්ග සමීක්ෂණයක් සිදු කළහ. එමඟින් මේ ආශ්‍රිත ඉඩම් කොටස් කිරීම සිදු කරන

ලද අතර වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් සිදු කරන ලද සමීක්ෂණය ඔස්සේ ලබා ගත් තොරතුරු ජනපද ව්‍යාප්ත කිරීමේ කාර්යය සඳහා බෙහෙවින් උපකාරී වූ බව සත්‍යයකි. මින්නේරිය වැව හුදෙක් ජලාශයක්ම පමණක් නොවේ. එමගින් ගිරිතලේ, කන්තලේ, කවුඩුලු වැව ආදී වැව්වලට ද ජලය සැපයීමේ කාර්යය සිදු කරන ලදි. එහෙයින් මින්නේරිය වැව ජලය ගබඩා කිරීම මෙන්ම ජලය සැපයීමට ද වැදගත් වන්නක් වශයෙන් හඳුනා ගත හැක. මේ අයුරින් විවිධ බාධක මධ්‍යයේ ඇති වන්නා වූ මින්නේරිය ගොවි ජනපදවල ආරම්භක අවධිය තුළ මින්නේරිය වැවේ ජලය උපයෝගී කර ගනිමින් වගා කළ ප්‍රමාණය පැරණි ගමේ අක්කර එකසිය හැත්තෑවක ප්‍රමාණයක් බව සඳහන් වේ. ඒ හැරුණු විට පැරණි ගමේ සිට අක්කර විස්සක දුරින් පිහිටා තිබුණු කුඩා පැරණි ගම්වල අක්කර තුන්සිය පනහක් පමණ මින්නේරිය වැවේ ජලය යොදා ගනිමින් වගා කටයුතු සිදු කරන ලද බව හඳුනා ගනී. මේ අයුරින් මින්නේරිය ගොවි ජනපද ව්‍යාපාරය ආරම්භ කිරීමේ ක්‍රියාවලියේ ආරම්භක උත්සවය සිදු වූයේ 1933 අප්‍රේල් 30 වන දින වන අතර වර්තමාන දියනබුබුල බෝධිරුක්ඛාරාමය අසල දී එවක වැඩ බලන ඇමතිව සිටි සර් ජෝන් කොතලාවල මහතා විසින් මීට අදාල පළමු පස් පිඩැල්ල කැපීම සිදු කරන ලදි. ඉන් අනතුරුව කැළෑ එළි පෙහෙළි කොට නව නිවාස ඉදි කිරීම ආරම්භ කරන ලද අතර එම නිවාස සාදා නිම කරන තෙක් මෙම ජනපදිකයින් වුදෙසා හතමුණ දුම්රිය ස්ථානය අසළ ඉදි කරන ලද මඩු දෙකක නවාතැන් පහසුකම් ලබා දෙනු ලැබීය. ගොවි ජනපද ඇති කිරීමේ ආරම්භක අවස්ථාවේ දී මුහුණ පෑමට සිදු වූ සෞඛ්‍යමය ගැටලුවලට නිවැරදිව මුහුණ දෙමින් මෙම අවස්ථාවේ නවාතැන් සඳහා ඉදි කරන ලද වාඩි ඈතින් පිහිටුවීම මෙන්ම ඉන් එක් වාඩියක මැලේරියා උවදුර නොතිබුණ දිස්ත්‍රික්කවලින් පැමිණි ජනයන් ද අනෙක් වාඩියේ මැලේරියා උවදුර තිබුණු දිස්ත්‍රික්කවලින් පැමිණියවුන් ද වෙන් කොට නවාතැන් ලබා දීම තුළ මින්නේරිය වැව ආශ්‍රිත ජනපද ඇති කිරීම තුළ සිදු වූ අඩුපාඩු අවම කර ගනිමින් ගොවි ජනපද ව්‍යාපාරය සාර්ථක කර ගැනීමට අවසන අවස්ථාව උදා විය. ඒ අනුව මින්නේරිය වැව පදනම් කර ගනිමින් මුල්ම ජනපදය ආරම්භ වන ලද්දේ හතමුණ දුම්රිය නැවතුම අසල භූමියක වේ. මෙලෙස ආරම්භ වන ජනපද ක්‍රමයෙන් දුම්රිය මාර්ගය හා මින්නේරිය පටන් ඒ දෙසට දිවෙන මාර්ගය හමු වන ස්ථානයන් තෙක්ම පැතිර යාම කාලයත් සමඟ සිදු විය. මෙම ස්ථානය පසුකාලීනව හිඟුරක්ගොඩ ලෙස නම් කළ අතර එය ජනපද කටයුතුවල මධ්‍යස්ථානය බවට පත් විය. මෙලෙස ජනපදය වර්ධනය වීමත් සමඟ හිඟුරක්ගොඩ නගරය වර්ධනය වීම ද ක්‍රම ක්‍රමයෙන් ජනතාවගේ යටිතල පහසුකම් සංවර්ධනය කරමින් ඩිස්පැන්සරියක්, මාතෘ හා ළදරු ඒකකයක්, පාසලක් යනාදිය මෙන්ම ජනපද ඇති කිරීමේ දී මුල් කාලයේ දී බලපෑ ගමනාගමන පහසුකම් සංවර්ධනය කරමින් මාර්ග පහසුකම් ඇති කිරීම ද සිදු කරන ලදි. මින්නේරිය ගොවි ජනපද ව්‍යාපාරයේ ආරම්භය මෙසේ සිදු විය.

**නිගමනය.**

මෙරට ගොවි ජනපද ව්‍යාපාරය පිළිබඳව අධ්‍යනය කිරීමේ දී වඩා වැදගත් තැනක් ගනු ලබන මින්නේරිය ගොවි ජනපද ව්‍යාපාරයේ ආරම්භය තුළ ගැටලුකාරී තත්ත්වයන් රැසක් හඳුනා ගත හැකි වුව ද පසු කාලීනව එම තත්ත්වයන් සියල්ලක් ම පාහේ මගහරවා ගනිමින් සාර්ථකත්වයට පත් විශිෂ්ඨ ගණයේ ජනපද ව්‍යාපාරයක් වශයෙන් මින්නේරිය වැව ආශ්‍රිතව සිදු කරන ලද මෙම ගොවි ජනපද ව්‍යාපාරය හඳුනා ගත හැක. විශේෂයෙන් ආරම්භක අවස්ථාවේ දී එවක පාලකයින්ගේ අනවභෝධය හේතුවෙන් මෙහි බොහෝ කාර්යයන් අසාර්ථක වී ඇති බව මෙම කරුණු අධ්‍යනය කිරීමේ දී අනාවරණය අතර මුල් කාලීනව පැවතියා වූ දුර්වල තත්ත්වයන් මඟහරවා ගනිමින් ඒ ආශ්‍රිත ජනයාට ද වැඩි ප්‍රතිලාභ ප්‍රමාණයක් හිමි කර දෙමින් සාර්ථක ව්‍යාපෘතියක් වශයෙන් මින්නේරිය ගොවි ජනපද

ව්‍යාපාරය ක්‍රියාත්මක වූ බව අවසන් වශයෙන් හඳුනා ගත හැක. එහෙයින් මෙරට ඇති කරන ලද පළමුවන සාර්ථක ගොවි ජනපදය වශයෙන් මින්නේරිය ගොවි ජනපදය හැඳින්වීමෙහි කිසිදු වරදක් නොවන බව මනාව පසක් වනු ඇත.

**පරිශීලන**


කරුණානන්ද, යූ.බී. 1991***, තමන්කඩුව* 1815-1900.** කැලණිය, කර්තෘ ප්‍රකාශනයකි.

Brohier, R.L (1998) ***The Tamankaduwa district and the Elehera – Minneriya canal.*** Colombo.